## 21. ශීර්ෂය 21 - විගණකාධිපති

-----------------------------

### 21.1 විගණන විෂය පථය

---------------------

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 17 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

### 21.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

--------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ

ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**21.3 විගණන නිරීක්ෂණය**

**----------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 21.4 සිට 21.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**---------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පාඩු හා හානි ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

**--------------------**

වැය විෂයයන් 05 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.55,315,546 ක්වූ ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 62 ත් සියයට 91 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) ආදායම් ගිණුම**

**-------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කළ ගිණුම් 01 කට අනුව රු.189,455,801 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 03 ක් අතර කාල පරාසයකට අදාල විය.

(ii) අදාල වන වර්ෂය පිළිබඳව නොසළකා, විගණන ගාස්තු බිල්පත නිකුත් කළ දිනය අනුව ගිණුම්ගත කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හා ඒ හේතුවෙන් ඇතැම් මහ නගර සභා, නගර සභා, දේශීය සභා හා සංස්ථා මණ්ඩල වැනි අර්ධ රාජ්‍ය ආයතන අතරින් කොටසක් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විටත් 2009 සිට 2012 දක්වා ඇතැම් වර්ෂයන් සඳහා බිල්පත් නිකුත් කර ගිණුම්ගත කර නොතිබුණි.

(iii) බිල්පත් ඉදිරිපත් කර තිබුණත් ඇතැම් ආයතනවලින් දීර්ඝ කාලයක සිට විගණන ගාස්තු අය වී නොතිබුණි.

(iv) ඇතැම් ආයතන වෙතින් පෙර වර්ෂයන් සඳහා විගණන ගාස්තු අයවී නොතිබුණත්, සමාලෝචිත වර්ෂයට හා මෑත වර්ෂයන් සඳහා විගණන ගාස්තු අය කර තිබුණි.

(v) දෙපාර්තමේන්තු යටතේ පවත්නා ඇතැම් අරමුදල් විගණනය කර තිබුණත්, විගණන ගාස්තු බිල් ඉදිරිපත් කර අයකරගෙන නොතිබුණි.

(vi) සංස්ථා මණ්ඩල සහ අර්ධ රාජ්‍ය ආයතන වෙතින් විගණන ගාස්තු අයකිරීම සඳහා අදාල අමාත්‍යාංශය වෙතින් පූර්ව අනුමැතිය ලබා ගැනීමේදී අසාමාන්‍ය ප්‍රමාදයන් සිදු වී තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 02101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.3,340,243 ක් විය.

**21.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

විගණන හා කළමනාකරණ කමිටුව ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.

**21.5 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/ 01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2014 ඔක්තෝබර් 31 දින වන විටත් ශාඛා 05 කට අදාල වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**21.6 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 354 | 213 | 141 |
| (ii) | ද්විතියික මට්ටම | 1,215 | 824 | 391 |
| (iii) | තෘතියික මට්ටම | 177 | 138 | 39 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 181 | 118 | 63 |
| | එකතුව | 1,927 | 1,293 | 634 |